2018

කාර්යසාධන වාර්තාව

செயலொற்றுகை அறிக்கை

Performance Report



Web: www.analyst.gov.lk
E-mail: govanalyst@sltnet.lk

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

அரசாங்க இரசாயனப் பகுப்பாய்வாளர் திணைக்களம்

Government Analyst's Department

2018 වසර සඳහා වන
වාර්ෂික කාර්යසාධන වාර්තාව

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො. 31, ඉසුරු මාවත,
පැලවත්ත, බත්තරමුල්ල.
www.analyst.gov.lk
govanalyst@sltnet.lk

වාර්ෂික කාර්යසාධන වාර්තාව - 2018

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව
නො. 31, ඉසුරු මාවත, පැලවත්ත, බත්තරමුල්ල.

මුද්‍රණය
ප්‍රින්ටෙක් එස්ටැබ්ලිෂ්මන්ට් පුද්ගලික සමාගම
52/1, වික්වත්ත පාර, මිරිහාන, නුගේගොඩ.
දුරකථන - 011 2815813/ විද්‍යුත් තැපෑල - sales@printec.lk
වෙබ් අඩවිය - www.printec.lk

Printed with VOC free, non toxic vegetable oil-based environmentally-friendly ink, on 100% recycled paper using wood free pulp which is made from 100% post consumer waste paper
(Paper recycling is the process of recovering waste paper and remarking it into new paper products.)

Recycling one ton of paper saves
17 mature trees, 26 m3 of water, 2.3 m3 of disposal space, 320 liters of oil, and 4,100 kilowatt-hours of electricity.

We encourage you to recycle this Document after use.

ඒ වැලිඅංග
ආණ්ඩුවේ රස පරීක්ෂක

පටුන

පරිච්ඡේදය 01 - ආයතනික තොරතුරු

1.1 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු
1.2 හැඳින්වීම
1.3 විෂයයන් හා කාර්යයන්
1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යූහය
1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විද්‍යාගාර
1.6 ගිණුම් අංශය හා ආයතන අංශය

පරිච්ඡේදය 02 - දෙපාර්තමේන්තු කාර්ය සාධනය

2.1 මූල්‍යමය කාර්ය සාධනය
2.2 භෞතික කාර්ය සාධනය
2.3 සමාජීය වැදගත්කමක් සහිත විශ්ලේෂණ
2.4 රසායනාගාර ප්‍රතීතකරණ ක්‍රියාවලිය

පරිච්ඡේදය 03 - වත්කම් කළමනාකරණය

3.1 ස්ථාවර වත්කම්
3.2 නවීන විද්‍යාත්මක විශ්ලේෂණ උපකරණ මිලදී ගැනීම

පරිච්ඡේදය 04 - මානව සම්පත් කළමනාකරණය හා පරිපාලනය

4.1 2018.12.31 දිනට කාර්ය මණ්ඩල දත්ත වාර්තාව
4.2 2018 වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු
    4.2.1 දේශීය පශ්චාත් උපාධි
    4.2.2 විදේශීය පශ්චාත් උපාධි

4.3 2018 වර්ෂයේ දේශීය පුහුණු හා හැකියා වර්ධන කටයුතු
4.4 2018 විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ

01
පරිච්ඡේදය

ආයතනික තොරතුරු

1.1 දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර හා අරමුණු

දැක්ම

සාධාරණ සහ නීතිගරුක සමාජයක්
ගොඩ නැගීම

මෙහෙවර

අධිකරණ, නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතන සහ වෙනත් ආයතනවලට
අධිකරණ විද්‍යා සහ ආහාර විද්‍යා ක්ෂේත්‍රයන්
සම්බන්ධ විද්‍යාත්මක විශ්ලේෂණ, විශේෂඥ සහ උපදේශක සේවාවන් සැපයීම.

අරමුණ

කාර්යක්ෂම සහ සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ
ක්‍රියාවලියට දායක වීම.

1.2 හැඳින්වීම

වර්ෂ 1904 සැප්තැම්බර් මාසයේ ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව එක් නිලධාරියෙකු සමඟ ආරම්භ කරනු ලැබූ ආණ්ඩුවේ රස පරීක්ෂක ආයතනයේ ප්‍රථම රස පරීක්ෂකවරයා ලෙස බ්‍රිතාන්‍ය ජාතික K.C. බ්‍රවුනින් මහතා ඉතිහාසයට එක්වේ.

ශ්‍රී ලංකා වෛද්‍ය විද්‍යාලයට අනුබද්ධිතව පැවති මෙම ආයතනය වසර 1913 දී රජයේ දෙපාර්තමේන්තුවක් ලෙස ස්ථාපිත විය. දෙපාර්තමේන්තුවක් ලෙස විකාශනය වෙමින් පැවති මෙම ආයතනය, වර්ෂ 1934 දී ස්වදේශ කටයුතු අමාත්‍යාංශය යටතේ කොළඹ 07, නිදහස් චතුරස්‍රයේ පැවති ගොඩනැගිල්ලක ප්‍රතිස්ථාපනය කරන ලදී.

ආරම්භයේ සිටම විදේශීය ප්‍රධානීන් යටතේ පැවති මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රථම ශ්‍රී ලාංකික රස පරීක්ෂකවරයා ලෙස ඩබ්.ආර්. වන්මුගම් මහතා 1945 දී පත්විය. ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ කාර්යයන් පුළුල් කරමින් 1935 දී සැක කටයුතු ලේඛණ පරීක්ෂා කිරීමේ කටයුතු ආරම්භ කරන ලද අතර 1940 දී ප්‍රථම සැක කටයුතු ලේඛන පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක ලෙස තම්බයියා නාගේන්ද්‍රන් මහතා පත් විය.

වර්ෂ 1960 දී ආරක්ෂක අමාත්‍යාංශය යටතේත්, 1978 දී අධිකරණ අමාත්‍යාංශය යටතේත් ක්‍රියාත්මක වෙමින් පැවති මෙහි ප්‍රථම කාන්තා රස පරීක්ෂකවරිය ලෙස 1993 දී යෝගරාණී මහේසන් මහත්මිය ඉතිහාසයට එක් විය.

විද්‍යාගාරයක් සඳහා උචිත නොවන ගොඩනැගිල්ලක ගැටළු රාශියකට මුහුණ දෙමින් වර්ෂ සියයකට අධික කාලයක් කොළඹ නිදහස් චතුරශ්‍රයේ පැරණි ගොඩනැගිල්ලක පැවැති රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, 2013 වසරේදී බත්තරමුල්ල, පැලවත්තේ කරනලද මහල් 06ක් සහිත නව විද්‍යාගාර හා කාර්යාල සංකීර්ණයකින් සමන්විත නව ගොඩනැගිල්ලක ස්ථාපිත කරන ලදී.

නවීන අංගෝපාංග වලින් සමන්විත නව විද්‍යාගාරය ස්ථාපිත කිරීම හා සමගාමීව නව තාක්ෂණ ක්‍රමවේද හඳුන්වාදීමට හැකිවීම, අපරාධ යුක්තිය ඉටුකිරීම සඳහා අවශ්‍ය විද්‍යාත්මක විශ්ලේෂණ කාර්යක්ෂම ලෙස ඉටු කිරීමට මහඟු පිටිවහලක් විය.

එසේම යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීමේදී අධිකරණ විද්‍යා අංශයට අත්‍යවශ්‍යව පැවැති DNA තාක්ෂණය මෙරටෙහි ස්ථාපිත කිරීමෙහිලා ශ්‍රී ලංකා රජය හා USAID ව්‍යාපෘතිය හා එක්ව DNA විද්‍යාගාරයක් 2013 වර්ෂයේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ නව ගොඩනැගිල්ලෙහි ආරම්භ කරන ලදී.

2015 ආරම්භ කරන ලද කොරියානු ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (KOICA) මඟින් ප්‍රදානය කරන ලද ව්‍යාපෘතිය මඟින් දෙපාර්තමේන්තුවේ DNA විද්‍යාගාරය වැඩිදියුණු කිරීමත්, ශ්‍රී ලංකාව තුල ප්‍රථම වරට පරිගණක අපරාධ විමර්ශණ විද්‍යාගාරයක් රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ ස්ථාපිත කිරීමත්, දෙපාර්තමේන්තුව මඟින් අපරාධ යුක්තිය පසිඳලීම සඳහා සපයන විද්‍යාත්මක සාක්ෂි, තවදුරටත් සඵලදායී කිරීම සඳහා ලැබුනු සුවිශේෂී පියවරකි.

මේ අයුරින් ලබාගන්නා ලද විද්‍යාත්මක විශ්ලේෂණ වල ඉහල ගුණාත්මකභාවය තුළින් 2016 වසරේදී රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ විද්‍යාගාර සඳහා ISO 17025 අන්තර්ජාතික ප්‍රතීතකරණය ලබාගත හැකිවිය.

වර්ෂ 1904 දී එක් නිලධාරියකුගෙන් ආරම්භ කළ මෙම දෙපාර්තමේන්තුවේ මේ වනවිට 20 වන රස පරීක්ෂකවරයා ලෙස ඒ. වැලිඅංග මහතා පත්වී ඇති අතර 6 වන සැක කටයුතු ලේඛන පරීක්ෂක ලෙස එස්. ඒ බටකන්දගේ මහතා පත්වී ඇත. අද වන විට විද්‍යාත්මක නිලධාරීන් 78ක් සේවය කරන අතර අධිකරණ විද්‍යා හා ආහාර විද්‍යා යන ප්‍රධාන ක්ෂේත්‍ර දෙක යටතේ ක්‍රියාත්මක වන රස පරීක්ෂක දෙපාර්තමේන්තුව නිහඬව වූද, අභිමානවූත් සේවයක් ඉටු කරනු ලබයි.

1.3 විෂයයන් හා කාර්යයන්

ආණ්ඩුවේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව අධිකරණ විද්‍යා අංශය සහ ආහාර විද්‍යා අංශය යන ප්‍රධාන අංශ දෙකකින් සමන්විත වන අතර එය ශ්‍රී ලංකාවේ ඇති එකම රජයේ අධිකරණ විද්‍යා විද්‍යාගාරය වේ. ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා, පුපුරණ ද්‍රව්‍ය හා ගිණි විමර්ශන, මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශය, මස්තු විද්‍යා හා DNA, ධූලක විද්‍යා, සැක කටයුතු ලේඛන, පරිගණක ඩිජිටල් අපරාධ විමර්ශන අංශය සහ විවිධ නඩු අංශය යනුවෙන් ප්‍රධාන අංශ අටකින් අධිකරණ විද්‍යා අංශය සමන්විත වේ. එමෙන්ම, ආහාර විද්‍යා අංශය ප්‍රධාන අංශ දෙකකින් එනම් ආහාර හා මධ්‍යසාර ලෙස විද්‍යාගාර දෙකකින් සමන්විත වේ .

මෙම දෙපාර්තමේන්තුව සේවාවන් සඳහා වෙන්වූ ආයතනයක් වන අතර, අධිකරණ, පොලිස් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා රේගුව, සුරාබදු දෙපාර්තමේන්තුව, පළාත් පාලන ආයතන, සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, වරාය අධිකාරිය හා වෙනත් රජයේ දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන මගින් යොමුකරනු ලබන නඩු භාණ්ඩ හා වෙනත් ආදර්ශ හා සාම්පල් විද්‍යාත්මක පරීක්ෂණයන්ට භාජනය කර විශ්ලේෂණ වාර්තා නිකුත් කිරීම සිදු කරනු ලබයි. මීට අමතරව විවිධ රාජ්‍ය, දෙපාර්තමේන්තු සහ රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතන මගින් ඉදිරිපත් කරනු ලබන ආහාර, මත්පැන්, කිරි හා ජලය ආශ්‍රිත ආදර්ශ වල තත්ත්වය පරීක්ෂා කර වාර්ථා ලබාදීම සිදු කෙරෙනු ලබයි. තවද අධිකරණ මඟින් ඉදිරිපත් කරනු ලබන සැක සහිත ලේඛණ පරීක්ෂා කර වාර්තා කිරීම සැකකටයුතු ලේඛණ අංශය මඟින් කරනු ලබයි.

පරීක්ෂණ සඳහා ඉදිරිපත් කරනු ලබන සියළුම නඩු භාණ්ඩ හෝ වෙනත් ආදර්ශ, ආහාර හා ඖෂධ පනත, ජාතික පාරිසරික පනත, සුරාබදු ආඥා පනත, දුම්කොළ හා මද්‍යසාර පිළිබඳ ජාතික අධිකාරී පනත,සුවඳ විලවුන් උපකරණ හා ඖෂධ පනත, පළිබෝධනාශක පාලනය කිරීමේ පනත, ගිණිඅවි ආඥා පනත, පුපුරණ ද්‍රව්‍ය ආඥා පනත, විෂ වර්ග, අබිං සහ අන්තරායකාර ඖෂධ පනත, මෝටර් වාහන පනත, අපරාධ නඩු විධාන සංග්‍රහය, සිවිල් නඩු විධාන සංග්‍රහය, සාක්ෂි ආඥා පනත වැනි විවිධ අණ පනත් යටතේ පරීක්ෂණයන්ට භාජනය කර වාර්තා නිකුත් කිරීම මෙම දෙපාර්තමේන්තුවෙන් සිදු කෙරේ.

තවද දිවයිනේ සිදු වන මිනී මැරුම්, ස්ත්‍රී දූෂණ, වෙඩිතැබීම්, පිපිරීම්, ගිනි ගැනීම් , මාරක රිය අනතුරු ආදී දරුණු ගණයේ අපරාධ හා සම්බන්ධ අපරාධ ස්ථාන විමර්ශණයන් සඳහා නිලධාරීන්ගේ විශේෂඥ සහාය පොලිස් දෙපාර්තමේන්තුව වෙත ලබා දේ. මීට අමතරව ප්‍රභූ රාජ්‍ය තාන්ත්‍රිකයන් සඳහා ආහාර පරීක්ෂාව සිදු කරනු ලබන්නේ ධූලක විද්‍යා (වස විෂ) අංශය මඟිනි.


අධිකරණයේ විශේෂඥ සාක්ෂිකරුවන් ලෙස රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද රස පරීක්ෂක වාර්තා සම්බන්ධයෙන් අප නිලධාරීන් දිවයිනේ විවිධ අධිකරණ වලදී විශේෂඥ සාක්ෂි ලබාදෙති.

මෙවැනි සේවා සැපයීමට අමතරව විවිධ ක්ෂේත්‍රවල නිපුණතා ලබා ඇති විශේෂඥ නිලධාරීන් විසින් රාජ්‍ය අනුග්‍රහය ලබන ආයතනවලට විද්‍යාත්මක උපදේශනයන්ද ලබාදීම සිදු කරයි. විශේෂයෙන්ම ආහාර පනත යටතේ සාදනු ලබන රෙගුලාසි සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ විවිධ ප්‍රමිති පිරිවිතර සෑදීමේදී මෙම නිලධාරීන්ගෙන් විශාල දායකත්වයක් ලබාදෙයි. ආරක්ෂක අමාත්‍යාංශයට අවශ්‍ය ආයුධ හා උපකරණ හා පුපුරන ද්‍රව්‍ය හා වෙනත් රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම් වලදී සහ වෙනත් ආයතනවල අධි තාක්ෂණික උපකරණ මිලදී ගැනීම් වලදී තාක්ෂණික කමිටු වලට විශේෂඥ සහාය ලබාදීමද මෙම නිලධාරීන් විසින් සිදුකරනු ලැබේ.

තවද පොලිස් නිලධාරීන්, අපරාධ පරීක්ෂණ නිලධාරීන්, ත්‍රිවිධ හමුදා නිලධාරීන්,නීතිපති දෙපාර්තමේන්තුවේ ආධුනික නීතීඥයන්ට හා අධිකරණ වෛද්‍ය නිලධාරීන් ,මහජන සෞඛ්‍ය පරීක්ෂකවරුන් සඳහා ඔවුන්ගේ අධිකරණ විද්‍යාත්මක හා ආහාර විද්‍යාත්මක දැනුම ප්‍රවර්ධනය සඳහා අප නිලධාරීන් විසින් දේශණ පවත්වනු ලබයි.

1.4 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය

4.2 දෙපාර්තමේන්තුවේ සංවිධාන ව්‍යුහය



1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විද්‍යාගාර

අධිකරණ විද්‍යා ක්ෂේත්‍රය

1. ගිනිඅවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යාව

ගිනිඅවි සහ අධිකරණ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය විසින් විවිධ වර්ගයේ ගිනි අවි එනම් රයිපල, පිස්තෝල, පතරොම් තුවක්කු, කොටන තුවක්කු සහ පතරොම් වර්ග ළඟි තබා ගැනීමකදී, මේවා අපරාධ සඳහා යොදාගත් බවට සැක කරන අවස්ථාවලදී ඒවා පරීක්ෂා කර වාර්තා නිකුත් කරනු ලබයි. ගිනි අවි භාවිතා කොට සිදු කරනු ලබන අපරාධ පිළිබඳව අන්වීක්ෂීය සැසඳුම් පරීක්ෂණ සිදුකරමින් විද්‍යාත්මකව විමර්ශණය කිරීම මීට ඇතුලත් වේ. ඒ සඳහා අපරාධවලදී භාවිතා කරන ලද ගිනි අවි, ගිනි අවි වල කොටස්, විවිධ පතරොම් වර්ග, වැයවූ පතරොම් කොපු හා උණ්ඩ ආදිය පරීක්ෂා කරනු ලැබේ. තවද වෙඩි තැබීම්වලට ලක්වූ මෝටර්රථ, ගොඩනැගිලි ආදියද පරීක්ෂාවට ලක්කරන අතර කුමන ගිනිඅවියක් අදාල අපරාධය සඳහා භාවිතා කලේද යන්න පිළිබඳ විශේෂඥ මතයන් ඉදිරිපත් කරනු ලැබේ.

2. පුපුරණ ද්‍රව්‍ය සහ ගිනි විමර්ශනය

මෙම අංශය මඟින් බෝම්බ පිපිරීම්, පුපුරණ ද්‍රව්‍ය හා පිපිරුම් උපක්‍රම (බෝම්බ) යමෙක් තම සන්තකයේ තබා ගැනීම් ඇතුළු පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර සිදුකරන අපරාධ වලට අදාල නඩු භාණ්ඩ විද්‍යාත්මක පරීක්ෂාවට භාජනය කරනු ලැබේ. සන්තකයේ තබා ගැනීමේදී අත් අඩංගුවට ගන්නා ලද විවිධ වර්ගයේ පිපිරුම් උපක්‍රම (දේශීය හා විදේශීයව) නිෂ්ක්‍රිය කිරීමෙන් පසු, ඒවායේ කොටස්ද මෙම නිලධාරීන් විසින් විශ්ලේෂණයට භාජනය කරනු ලබයි. එමෙන්ම දේපල, ගොඩනැගිලි හා වාහන ආදිය ගිනිගැනීම් වලදී පොලීසියට කරනු ලබන පැමිණිලි හා රක්ෂණ වන්දි සඳහා කරනු ලබන ඉල්ලීම් අනුව එම ගිනි ගැනීම් පිළිබඳව විමර්ශණය කර ගිනි ගැනීමට හේතුව සම්බන්ධයෙන් මතයන් ඉදිරිපත් කිරීමද මෙම අංශයේ නිලධාරීන්ගේ කාර්යයට අදාල වේ.

3. මත් ද්‍රව්‍ය හා මනෝවර්තන

පොලීසිය, මත්ද්‍රව්‍ය කාර්යාංශය හෝ රේගුව විසින් අල්ලාගනු ලබන තහනම් මත් ද්‍රව්‍ය හා මනෝවර්තක ද්‍රව්‍ය වන හෙරොයින්, කොකේන්, ගංජා සහ විවිධ මත්පෙති යනාදිය රසායනිකව හඳුනා ගැනීම හා ඒවායේ අඩංගු ක්‍රියාකාරී සංඝටක වල සංශුද්ධතාවය විශ්ලේෂණය කර අධිකරණය වෙත වාර්තා කිරීම මෙම අංශය මඟින් සිදුකරයි.

4. අධිකරණ මස්තු විද්‍යා සහ ඩී.එන්.ඒ.

විවිධ දරුණු අපරාධ සම්බන්ධයෙන් සාක්ෂි වශයෙන් ලබා ගන්නා ජීව විද්‍යාත්මක ද්‍රව්‍යය මෙන්ම, ජීව විද්‍යාත්මක මව, පියා සහ දරුවන් යන මෙම පාර්ශව අතර සම්බන්ධතාවය ලබා ගැනීම සඳහා මිනිස් ශරීරයේ අසථී කැබලි, දත් හා ශාරීරික තරල ඇතුලු ඕනෑම ජීව විද්‍යාත්මක ද්‍රව්‍යයක් අනුසාරයෙන් පරීක්ෂණ කටයුතු සිදු කර, ඩී.එන්.ඒ. තාක්ෂණය ආශ්‍රයෙන් වාර්තා නිකුත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්යභාරය වේ.

එමෙන්ම සංකීර්ණ මිනීමැරුම් සහ අපරාධ ස්ථාන වල වූ රුධිර පැල්ලම්, කෙස්, ලේ විසිරීම් රටා, කෙඳි, සීරීම් සලකුණු ආදී ජීව විද්‍යාත්මක භෞතික සාක්ෂි පරීක්ෂා කර, විශ්ලේෂණයෙන් අනතුරුව වාර්තා නිකුත් කිරීමද මෙම අංශයේ රාජකාරිවලට අයත් වේ.

මීට අමතරව වාහන අනතුරුවලට අදාල වන වාහන අනතුරු වූ ස්ථාන සහ අදාල අනෙකුත් සාක්ෂි විද්‍යාත්මකව පරීක්ෂා කර එම අනතුරු ප්‍රති නිර්මාණය කර අවශ්‍ය වැදගත් සාක්ෂි සොයා ගැනීම මෙම අංශයේ විශේෂඥයින්ගේ වගකීමකි.

5. අධිකරණ ධූලක විද්‍යාව

අධිකරණ ධූලක විද්‍යා අංශයේ සිටින විශේෂඥයන් විසින් අධිකරණ වෛද්‍ය කාර්යයන් හා අපරාධ විමර්ශණ සඳහා වස වර්ග හඳුනා ගැනීම පිණිස විශ්ලේෂණ කටයුතු රාශියක් සිදු කරනු ලැබේ. අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් හෝ අධිකරණය විසින් භාර දෙනු ලබන සැක සහිත සහ හදිසි මරණවලට භාජනය වූ

තැනැත්තන්ගේ පශ්චාත් මරණ පරීක්ෂණවලදී ලබාගත් ශරීර කොටස් හා ආදර්ශ, මත් ද්‍රව්‍ය සහ අනෙකුත් වස වර්ග වන සයනයිඩ්, පලිබෝධ නාශක වර්ග, විඛාදක අම්ල වර්ග සහ කාබන් මොනොක්සයිඩ් වැනි අහිතකර රසායනික ද්‍රව්‍ය හඳුනාගැනීම සඳහා විශ්ලේෂණය කිරීම, බීමත්ව රිය පැදවීම සැක කරන අවස්ථාවලදී සහ මාරක රිය අනතුරුවලදී මත්පැන් හෝ වෙනත් ඖෂධ භාවිතා කර තිබේදැයි හඳුනා ගැනීම සඳහා පුද්ගලයින්ගේ රුධිරය සහ මුත්‍රා සාම්පල විශ්ලේෂණය කිරීම, අපරාධ ස්ථානයෙන් සොයාගත් අධිකරණ විද්‍යාත්මකව වැදගත් භෞතික සාක්ෂි (ඖෂධ පෙති, වස බෝතල, ඉතිරිවූ ආහාර ද්‍රව්‍ය ආදිය) ද මත්ද්‍රව්‍ය, විෂ වර්ග සහ අම්ල වර්ග හඳුනාගැනීම සඳහා රසායනික විශ්ලේෂණ මෙම අංශය මඟින් සිදු කෙරේ.

6. අධිකරණ විද්‍යාත්මක සැකකටයුතු ලේඛන

අධිකරණමය හා නීතිමය කටයුතු සඳහා අවශ්‍ය වන සැක සහිත ලිපි ලේඛන මෙම අංශය මඟින් පරීක්ෂාවන්ට ලක් කෙරේ.

සියළු වර්ගවල සැකකටයුතු ලේඛන, අත්අකුරු සහ අත්සන් ආදිය, මෙම අංශයේදී ඒවායේ නිරව්‍යාජභාවය සඳහා පරීක්ෂා කරනු ලැබේ. තවද ලේඛණ වල තිබෙන වෙනස්කිරීම්, මැකීම්, විකෘති කිරීම්, එකතු කිරීම් සහ ආදේශ කිරීම් ආදිය හඳුනාගැනීම, ගමන් බලපත්‍ර, වීසා, ලිවීමේ උපකරණ, තීන්ත, කඩදාසි සහ අලවන ද්‍රව්‍ය, පිළිස්සුනු සහ විකෘති කරන ලද ලේඛන, ව්‍යාජ මුදල් නෝට්ටු, ලොතරැයිපත්, ආදායම් මුද්දර, තැපැල් මුද්දර සහ (රජයේ) ආදායමට සම්බන්ධ වෙනත් යම් ලේඛන පරීක්ෂා කර ඒවායේ නිර්ව්‍යාජ බව හෝ අදාල වෙනත් මතයන් අදාල ආයතන වෙත ඉදිරිපත් කිරීම මෙම අංශයේ විශේෂඥ නිලධාරීන්ගේ වගකීම වේ.

7. පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ විද්‍යාගාරය

මෑතකදී ස්ථාපිත කර ඇති ඩිජිටල් අපරාධ විශ්ලේෂණ අංශය මූලික ලෙස ඩිජිටල් දත්ත විශ්ලේෂණය, ඩිජිටල් ඡායාරූප විශ්ලේෂණය, කටහඬ හා ශබ්ද විශ්ලේෂණය හා ජීවමිතික ලක්ෂණ විශ්ලේෂණය යන මූලික අංශ 4ක් යටතේ විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබයි.

පරිගණක, ජංගම දුරකථන, CCTV DVR යන්ත්‍ර ආදී ඩිජිටල් උපාංග තුල අන්තර්ගත දත්ත විශ්ලේෂණය හා ඒවායේ මකා දමා ඇති දත්ත ප්‍රතිඋත්පාදනය, CCTV වීඩියෝ දත්ත විශ්ලේෂණය, ජීවමිතික ලක්ෂණ ඇසුරින් CCTV දර්ශණ වල පෙනී සිටින පුද්ගලයින්ගේ මුහුණු හඳුනාගැනීම, CCTV දර්ශණ වල ඇතුලත් අපැහැදිලි වාහන ලියාපදිංචි අංක තහඩු හඳුනාගැනීම, ඩිජිටල් ඡායාරූප හා වීඩියෝ පට වැඩි දියුණු කිරීම විශ්ලේෂණය හා වෙනස්කිරීම් වලට ලක්කර ඇතිද යන්න හඳුනාගැනීම, කටහඬ විශ්ලේෂණය මඟින් පටිගත කරණ ලද සංවාදයන්හි කටහඬහි අනන්‍යතාවය තහවුරු කිරීම ආදී විශ්ලේෂණ මෙහිදී සිදු කරයි.

8. විවිධ අපරාධ

විවිධ අංශයේ සිටින අධිකරණ විද්‍යා විශේෂඥයින් විසින් අනිකුත් විෂයයන් යටතේ නිශ්චිතව වර්ගීකරණය කිරීමට නොහැකි අන්‍යාකාර වූ භෞතික සාක්ෂි පරීක්ෂාවට භාජන කරනු ලැබේ. සැක කටයුතු වාහනවල චැසි අංක සහ එන්ජින් අංක පරීක්ෂා කිරීම සහ ඒවා සත්‍ය ද, වංචනික ද යන්න නිගමනය කිරීම හා බද්ධ කරන ලද වාහන හඳුනා ගැනීම එක් උදාහරණයකි. තවද අපරාධ වලට සම්බන්ධ විවිධ වර්ගයේ ස්පර්ශ සාක්ෂි හා භෞතික සාක්ෂි උදා : විදුරු කැබැලි, තීන්ත පතුරු, කෙඳි වර්ග, පස්, ආයුධ, ආයුධ සලකුණු, විවිධ සලකුණු (ඇඟිලි සලකුණු හැර), ලාංඡන ආදිය සඳහා විද්‍යාත්මක පරීක්ෂණ හා විවිධ තාක්ෂණික රසායන උපකරණ භාවිතා කරමින් රසායනික විශ්ලේෂණ ක්‍රම මඟින් හඳුනා ගැනීම සහ සංසන්ධනය මෙම අංශය මඟින් සිදු කරනු ලැබේ.

ආහාර විද්‍යා ක්ෂේත්‍රය

1. ආහාර විද්‍යාගාරය

1980 අංක 26 දරන ආහාර පනත යටතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ බලයලත් නිලධාරීන් (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්, ආහාර පරීක්ෂකවරයන්, මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීන් ආදිය) විසින් ඉදිරිපත් කරනු ලබන ආහාර සාම්පල, කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම. ආහාර පාලන ඒකකය මඟින්, අනෙකුත් රජයේ ආයතන මඟින් සහ පුද්ගලික ආයතන මඟින් එවනු ලබන එවැනි ආහාර සාම්පල,

විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම හා රේගු දෙපාර්තමේන්තුව, පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා තේ මණ්ඩලය සහ ශ්‍රී ලංකා ප්‍රමිතිය ආයතනය ආදිය විසින් ඉදිරිපත් කරනු ලබන සාම්පල විශ්ලේෂණය කර වාර්තා නිකුත් කිරීම. ජාතික පාරිසරික පනත යටතේ, ආණ්ඩුවේ විවිධ ආයතන සහ සංස්ථා සඳහා, පානීය ජලය සහ කර්මාන්ත අප ජලය විශ්ලේෂණය කර තත්ත්ව වාර්තා නිකුත් කිරීම.

2. මද්‍යසාර විද්‍යාගාරය

අධිකරණය මගින් විශ්ලේෂණය සඳහා අප දෙපාර්තමේන්තුව වෙත එවනු කරනු ලබනු නීති විරෝධී මත්පැන් සහ දුම්කොළ නිෂ්පාදන විශ්ලේෂණය කර සුරාබදු ආඥා පනත යටතේ අධිකරණය වෙත වාර්ථා නිකුත් කිරීම සහ සුරාබදු දෙපාර්තමේන්තුව මගින් ඉදිරිපත් කරනු ලබන දේශීය සහ විදේශීය මත්පැන් සඳහා තත්ත්ව වාර්ථා නිකුත් කිරීම මෙම අංශය මගින් සිදු කරනු ලබයි.

සුරාබදු දෙපාර්තමේන්තුව දේශීය හා විදේශීය මත්පැන් සඳහා බලපත්‍ර නිකුත් කිරීමේදී අදාල මත්පැන් සාම්පල මෙම අංශයට යොමු කර තත්ත්ව වාර්ථාවක් ලබා ගන්නා අතර, එම විශ්ලේෂණ කටයුතු සඳහා අය කිරීමක් සිදු කරනු ලබයි. මෙමගින් 2018 වර්ෂය තුලට රුපියල් 6,327,700/- ක මුදලක් අයකර එම මුදල රාජ්‍ය භාණ්ඩාගාරය වෙත බැර කර ඇත.

1.6 ගිණුම් අංශය හා ආයතන අංශය

ගිණුම් අංශය

දෙපාර්තමේන්තුවේ මුඛ්‍ය පරමාර්ථය වන කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායක වීම සඳහා අවශ්‍ය සම්පත් සහ යටිතල පහසුකම් සැපයීමට අවශ්‍ය වන අරමුදල් රැස්කිරීම සහ ඒවා කාර්යක්ෂමව, ඵලදායී සහ ආර්ථිකමය වශයෙන් මෙහෙයවීම තුළින් මූල්‍ය කළමනාකරණය කිරීම හා ඊට සම්බන්ධ ගිණුම් කටයුතු පවත්වාගෙන යාමද, මූල්‍ය තොරතුරු අවශ්‍ය වෙනත් පාර්ශවයන් වෙත ලබා දීමද මූල්‍ය අංශයේ වගකීම වේ.

එම කටයුතු කර ගෙන යාමේදී,

- කාර්යක්ෂම හා සඵලදායක මූල්‍ය කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කිරීම.
- මූල්‍ය උපදෙස් හා මධ්‍ය පෙන්වීම.
- ආයතනය සතු වත්කම් වල ආරක්ෂාව තහවුරු කිරීම.
- රාජ්‍ය මුදල් රෙගුලාසි හා චක්‍ර ලේඛ විධිවිධාන වලට අනුකූලව මූල්‍ය පරිහරණය කිරීම.
- ගිණුම්කරණය හා වාර්තා කිරීම යනාදී කටයුතු කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරනු ලබයි.

ආයතන අංශය

පුහුණු හා කාර්යක්ෂම මානව සම්පතක් ලබාදීම සහතික කිරීම, කාර්යක්ෂම හා සාධාරණ ලෙස යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට දායකවීමේදී අවශ්‍ය පහසුකම් සැපයීම හා අනෙකුත් සම්බන්ධීකරණ කටයුතුද මෙම අංශයෙන් සිදු කරයි. ඒ යටතේ අවශ්‍ය කරන කාර්ය මණ්ඩලය අනුමත කරවා ගැනීම, පුහුණු කිරීම, ස්ථාන මාරු කිරීම, උසස් කිරීම හා විනය පාලන කටයුතු, අතිකාල, ගමන් වියදම් හා අවශ්‍ය අවස්ථාවන්හිදී පරිපාලනයට අදාල අභ්‍යන්තර චක්‍ර ලේඛ නිකුත් කිරීම මෙම අංශයෙන් ඉටු කරනු ලබයි.

02
පරිච්ඡේදය

දෙපාර්තමේන්තු කාර්ය සාධනය

2.1 මූල්‍යමය කාර්යසාධනය

ප්‍රතිපාදන වැය කළ ආකාරය

2018 අයවැය ඇස්තමේන්තුව මගින් වැය ශීර්ෂ 233 වැඩසටහන් අංක 01 ව්‍යාපෘති 01 යටතේ මෙම දෙපාර්තමේන්තුව සඳහා වෙන් කර තිබූ ප්‍රතිපාදන වැය කළ ආකාරය 2017 වසරට සාපේක්ෂව පහත දැක්වේ.

(000')

වැය විස්තරය	2017			2018		
	අනුමත ප්‍රතිපාදනය (රුපියල්)	මුළු වියදම (රුපියල්)	වියදම් ප්‍රතිශතය (%)	අනුමත ප්‍රතිපාදනය (රුපියල්)	මුළු වියදම (රුපියල්)	වියදම් ප්‍රතිශතය (%)
පුනරාවර්තන වියදම්	267,219	250,807	94	336,955	319,794	94
පුද්ගල පඩිනඩි	131,620	130,837	99	145,300	144,331	99
ගමන් වියදම්	3,605	3,549	98	5,580	5,540	99
සැපයීම	48,490	38,735	80	107,250	92,490	86
නඩත්තු වියදම්	16,805	13,283	79	11,860	11,714	98
සේවා	57,820	55,743	96	56,225	55,174	98
මාරු කිරීම්	1,940	1,914	99	2,200	2,030	92
බාහිර විශ්ලේෂණ සඳහා ගෙවීම්	6,939	6,742	97	8,540	8,510	99
මූලධන වියදම්	108,260	103,085	95	98,740	70,397	71
මූලධන වත්කම්වල පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම	500	495	99	740	488	66
මූලධන වත්කම් අත්පත් කර ගැනීම	82,000	76,993	94	76,050	47,959	63
හැකියා වර්ධනය	10,900	10,738	99	21,950	21,949	99
මුළු වියදම්	375,479	353,892	94	435,695	390,192	89

රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ''බී'' ගිණුම

(000')

විස්තරය	2017		2018	
	අනුමත සීමාව (රු.)	තත්‍ය වියදම (රු.)	අනුමත සීමාව (රු.)	තත්‍ය වියදම (රු.)
උපරිම වියදම් සීමාව	8,000	7,330	9,000	8,537
අවම ලැබීම් සීමාව	5,500	5,887	5,500	6,183
උපරිම හර ශේෂ සීමාව	35,000	18,149	32,000	20,523

2.2 භෞතික කාර්ය සාධනය

2018.01.01 සිට 2018.12.31 දක්වා විශ්ලේෂණ වාර්තා ප්‍රගතිය


ක්ෂේත්‍රය	විද්‍යාගාරය	2018.01.01 වන විට වාර්තා නොකල නඩු සංඛ්‍යාව	ලැබී ඇති නඩු සංඛ්‍යාව	වාර්තා කල නඩු සංඛ්‍යාව	2018.12.31 දිනට වාර්තා නොකල නඩු සංඛ්‍යාව
අධිකරණ විද්‍යා	මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක	1,484	14,643	11,242	4,885
	ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා	280	412	434	258
	පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන	153	464	497	120
	ධූලක විද්‍යා (වස වර්ග)	1,306	2,714	2,371	1,649
	මස්තු විද්‍යා හා DNA	1,999	1,751	1,052	2,698
	සැක කටයුතු ලේඛණ	467	880	853	494
	පරිගණක ඩිජිටල් අපරාධ	211	708	327	592
	විද්‍යා විවිධ නඩු	204	462	362	304
	එකතුව				**11,000**
ආහාර විද්‍යා	මත්පැන්	20	5,483	5,417	86
	මධ්‍යසාර හා දුම්කොළ	29	3,118	3,047	100
	ආහාර පනත යටතේ ආහාර සාම්පල	13	9,016	8,759	270
	විවිධ ආහාර වර්ග	02	2,515	2,286	231
	එකතුව				**687**
	එකතුව	**6,168**	**42,166**	**36,647**	**11,687**

ආහාර විද්‍යා අංශයේ වාර්තා ප්‍රමාදයකින් තොරව සහ කෙටි කාලයක් ඇතුළත වාර්තා කරනු ලබයි. එසේ වුවද අධිකරණ විද්‍යා අංශයේ නඩු භාණ්ඩ විශ්ලේෂණයේදී යම් ප්‍රමාදයක් සිදුවන අතර, මෙහිදී එම අංශයට ලැබෙන නඩු භාණ්ඩ වල සංඛ්‍යාව ඉහළ යාම හා විවිධ වර්ගයේ අපරාධ නඩු වලට අදාළ නඩු භාණ්ඩ වල විවිධත්වය, සංකීර්ණත්වය හා අවශ්‍ය විශ්ලේෂණ වල සංකීර්ණත්වය මෙම ප්‍රමාදයට හේතුවේ.

ලැබුණු හා වාර්තා කල නඩු සංඛ්‍යාව සැසඳීම

වර්ෂය	ලැබුණු නඩු සංඛ්‍යාව	වාර්තා කල නඩු සංඛ්‍යාව
2017	32,388	31,164
2018	42,166	36,647

නඩු සංඛ්‍යාව



2017 වර්ෂයට සාපේක්ෂව 2018 වසර තුල ලැබුණු නඩු සංඛ්‍යාව 9,778 කින් ඉහල ගොස් ඇත. එහෙත්, 2018 වසර තුලදී, 2017 වසර තුලදී නිකුත් කල වාර්තා සංඛ්‍යාවට වඩා වැඩියෙන් වාර්තා 5,483ක් නිකුත් කිරීමට හැකි විය. 2017 වසර අවසානයේ වාර්තා නොකර ඉතිරි වූ නඩු සංඛ්‍යාව 6,168 ක් වූ අතර 2018 වසර අවසන් වන විට වාර්තා නොකර ඉතිරි වූ නඩු සංඛ්‍යාව 5,519 කින් වැඩි වී ඇත. මේ අයුරින් වසර අවසානයේ වාර්තා නොකල නඩු සංඛ්‍යාව වැඩිවීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ පසුගිය වසරට වඩා ලැබුණු නඩු සංඛ්‍යාව 9,778 ක සංඛ්‍යාවකින් ඉහළ යෑම වේ. තවද මෙම කාලය තුලදී මානව සම්පත් වර්ධනය වීමක් සිදුවී නොමැත.

නඩු භාණ්ඩ විශ්ලේෂණ වලට අමතරව ශ්‍රී ලංකාවේ විවිධ ප්‍රදේශවල ඇති අධිකරණ වල වාචික විශේෂඥ සාක්ෂි සැපයීම සහ විවිධ අපරාධ ස්ථාන විමර්ශනයන් සඳහා නිලධාරීන් සහභාගී වීම, වාර්තා නොකල නඩු සංඛ්‍යාව ඉහළ යාම කෙරෙහි සෘජුවම බලපා ඇත.

2018 වර්ෂයේදී නිලධාරීන් විසින් ගරු අධිකරණය ඉදිරියේ වාචික සාක්ෂි සැපයූ අවස්ථා, පරීක්ෂා කළ අපරාධ ස්ථාන සංඛ්‍යාව සහ ශ්‍රී ලංකාවට පැමිණෙන ප්‍රභූ රාජ්‍යතාන්ත්‍රිකයන් සඳහා ආහාර පරීක්ෂා සිදුකල අවස්ථා සංඛ්‍යාව හා මෙම ක්ෂේත්‍රයේ වෙනත් ආයතනවල නිලධාරීන් සඳහා පවත්වන ලද දේශණ සංඛ්‍යාව පහත පරිදි වේ.

ගරු අධිකරණ වලදී වාචික සාක්ෂි සැපයූ අවස්ථා සංඛ්‍යාව	-	416
අපරාධ ස්ථාන විමර්ශනයන් සඳහා සහභාගී වූ අවස්ථා සංඛ්‍යාව	-	194
ධූලක විද්‍යා අංශයේ නිලධාරීන් සහභාගී වූ ප්‍රභූ ආහාර පරීක්ෂණ අවස්ථා ගණන	-	නිලධාරී දින 33
අපරාධ හා ආහාර විද්‍යාව සම්බන්ධයෙන් වෙනත් ආයතනවල නිලධාරීන් සඳහා දේශණ පැවැත්වීම	-	දේශණ දින 47

2.3 සමාජීය වැදගත්කමක් සහිත විශ්ලේෂණ තොරතුරු

ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය

ගිනි අවි හා ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය වෙත ඉදිරිපත් කරන ලද නඩු භාණ්ඩ අතරින් ප්‍රධාන වශයෙන් නීති විරෝධී ලෙස ගිනි අවි සන්තකයේ තබා ගැනීම, වෙඩි තැබීම් හා සම්බන්ධ ගිනි අවි හා ඊට අදාළ අනෙකුත් නඩු භාණ්ඩ විශ්ලේෂණය කරනු ලැබේ. තවද වෙඩි තැබීම් හා අපරාධ විමර්ශණය සඳහා මෙම අංශයේ විශේෂඥ නිලධාරීන් පොලීසියට හා අනෙකුත් විමර්ශණ නිලධාරීන් හට සහාය ලබාදේ.

පිස්තෝල, රිවෝල්වර්, රයිෆල්, ස්වයංක්‍රීය ගිනි අවි, දේශීයව සාදන ලද කොටන තුවක්කු, වැයවූ උණ්ඩ හා හිස් පතරොම් කොපු ආදිය මෙම අංශය මඟින් පරීක්ෂා කරන නඩු භාණ්ඩ වලට අයත් වේ.

2018 වසර තුල වාර්තා කරන ලද නඩු වලට අදාල සංඛ්‍යාත්මක අගයන් පහත වගුවේ දක්වා ඇත.

ස්වභාවය	වාර්තා සංඛ්‍යාව	ප්‍රතිශතය
ගිනි අවි සන්තකයේ තබා ගැනීම්	193	45%
වෙඩි තැබීම්	182	42%
වෙනත්	59	14%
එකතුව	434	

ධූලක විද්‍යා විද්‍යාගාරය

අධිකරණ වෛද්‍ය නිලධාරීන් විසින් පශ්චාත් මරණ පරීක්ෂණ වලදී ලබා ගන්නා ලද ශරීර කොටස් හා ශරීර තරල අතරින් මාර්ග අනතුරු වලින් මිය ගිය පුද්ගලයින්ගේ රුධිර සාම්පල ධූලක විද්‍යා අංශයේදී ඊතයිල් මද්‍යසාරය සඳහා විශ්ලේෂණය කරනු ලැබේ. තවද දියේ ගිලී මියගිය මරණ හා ගෙල වැලලා මිය ගිය පුද්ගලයන්ගේ රුධිරය මධ්‍යසාර සඳහා විශ්ලේෂණය කරනු ලැබේ.

එවැනි රුධිර සාම්පල වල මධ්‍යසාර හදුනාගත් අවස්ථා සංඛ්‍යාව පහත වගුවේ දක්වා ඇත.

	විශ්ලේෂණ සංඛ්‍යාව	මධ්‍යසාර හදුනාගත් සංඛ්‍යාව	ප්‍රතිශතය
මාර්ග අනතුරු	342	230	67%
දියේ ගිලීම	29	18	62%
ගෙල වැලලා ගැනීම්	48	29	60%
එකතුව	419	277	

පරිගණක හා ඩිජිටල් අපරාධ විශ්ලේෂණ අංශය

2016 වසරේදී ආරම්භ කරන ලද පරිගණක අපරාධ විශ්ලේෂණ අංශය වර්තමානයේ ශ්‍රී ලංකාවේ තිබෙන පරිගණක අපරාධ විශ්ලේෂණ හා විමර්ශන සේවාවන් සපයන එකම විද්‍යාගාරය වේ. මෙම විශ්ලේෂණ ප්‍රධාන අංග 4කින් සමන්විත වේ.

1. Digital - පරිගණක සහ ලැප්ටොප් පරිගණක වල දෘඩ තැටි, සඤඔඩ, ඩී. වී. ආර් යන්ත්‍රවල දෘඩ තැටි සහ ජංගම දුරකතන විශ්ලේෂණය
2. Image - වාහන අංක තහඩුවල ඡායරූප වැඩි දියුණු කිරීම හා හදුනා ගැනීම, ඡායාරූප, ඩිජිටල් ඡායාරූප හෝ වීඩියෝ දර්ශන සංස්කරණය කර ඇත්දැයි පරීක්ෂා කිරීම.
3. Bio Metry - මුහුණු සංසන්දනය සහ හදුනා ගැනීම. CCTV තිරයේ/වීඩියෝ දර්ශනවල සැකකරුවන් සහ පුද්ගල මුහුණු සංසන්දනය කිරීම.
4. Audio - හඬපට සංස්කරණය කර ඇත්දැයි පරීක්ෂා කිරීම, හඬපට වැඩි දියුණු කිරීම, හඬපට සහ කටහඬ හිමි සැකකරුවන්ගේ කට හඬ හදුනා ගැනීම.

පහත වගුවේ පරිගණක විශ්ලේෂණ අංශය මගින් 2018 වර්ෂයේදී නිකුත් කරන ලද වාර්තා සංඛ්‍යාව, 2017 වසරට සාපේක්ෂව සඳහන් කර ඇත.

විශ්ලේෂණ වර්ගය	2017 වසර	2018 වසර
Digital	93	126
Image	150	150
Biometric Analysis	17	28
Audio	05	23
එකතුව	265	327

මස්තුවිද්‍යා DNA විද්‍යාගාරය

DNA විද්‍යාගාරයේ නඩු 641 ට අදාලව පරීක්ෂණ වාර්තා අධිකරණය වෙත ඉදිරිපත් කර ඇත. ඒවායේ සංඛ්‍යාත්මක අගයන් පහත වගුවේ දක්වා ඇත.

ස්වභාවය	වාර්තා සංඛ්‍යාව	ප්‍රතිශතය
මිනීමැරුම්	248	39%
ලිංගික අපරාධ	207	34%
පීතෘත්වය	186	32%
එකතුව	641	

2018 වසරේ DNA වාර්තා වෙනුවෙන් රුපියල් 9,563,500.00 මුදලක් පොලිස් දෙපාර්තමේන්තුවෙන් අයකර ගෙන රාජ්‍ය භාණ්ඩාගාරය වෙත බැර කර ඇත.

මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශය

2018 වසරේදී මත්ද්‍රව්‍ය හා මනෝවර්තක අංශය වෙත නඩු 14,643 විශ්ලේෂණ සඳහා භාරදී ඇති අතර 2017 වසරේදී ලැබුණ නඩු සංඛ්‍යාව 10,782කි. වසරක් තුළ 3,861කින් එනම් ආසන්න වශයෙන් 36%කින් මත්ද්‍රව්‍ය නඩු සංඛ්‍යාව ඉහළ යෑමෙන් පෙන්නුම් කරන්නේ රට තුල ඇති නීති විරෝධී මත්ද්‍රව්‍ය වල ව්‍යාප්තියයි.

2017 වර්ෂයේ සහ 2018 වර්ෂය තුල ලැබුණ මත්ද්‍රව්‍ය නඩු සංඛ්‍යාවේ වර්ධනය පහත වගුවේ දක්වා ඇත.

වර්ෂය	ලැබුණු නඩු භාණ්ඩ ප්‍රමාණය	වාර්තා කල නඩු භාණ්ඩ ප්‍රමාණය
2017	10,782	10,252
2018	14,643	11,242
එකතුව	25,425	21,494

2018 වර්ෂය තුළ විශ්ලේෂණය සඳහා ඉදිරිපත් වූ නඩු භාණ්ඩ වල වර්ගීකරණය පහත වගුවේ දක්වා ඇත.

මත්ද්‍රව්‍ය වර්ගය	2018 වසර තුළ විශ්ලේෂණය සඳහා ඉදිරිපත් වී ඇති නඩු සංඛ්‍යාව
හෙරොයින්	11,699
කැන්බිස් (ගංජා)	2,028
කොකේන්	12
විවිධ මත්ද්‍රව්‍ය වර්ග	165
හඳුනා නොගත් මත්ද්‍රව්‍ය	739
එකතුව	14,643

සන්තකය, ජාවාරම, ආනයනය හෝ අපනයනයේදී අත් අඩංගුවට ගන්නා ලද හෙරොයින් හෝ කොකේන් අඩංගු කුඩු සාම්පල වල ශුද්ධ හෙරොයින් හා කොකේන් ප්‍රමාණය ග්‍රෑම් 2ට වැඩි වන විට වරදකරුවන් හට අධිකරණය මඟින් ජීවිතාන්තය දක්වා සිර දඩුවම් හෝ මරණීය දණ්ඩනය නියම වේ.

මේ අනුව දල බර ග්‍රෑම් 2ට වැඩි වන විට හෙරොයින් හා කොකේන් අඩංගු කුඩු සාම්පල වල ශුද්ධ හෙරොයින් හා කොකේන් ප්‍රමාණය තීරණය කිරීම සඳහා විශ්ලේෂණය කල යුතුය.

2018 වසර තුල විශ්ලේෂණය කරන ලද නඩු වලින්, හෙරොයින් ග්‍රෑම් 2ට වැඩි ශුද්ධ බරකින් යුක්ත නඩු 430ක් අධිකරණය වෙත වාර්තා කර ඇත.

ආහාර අංශය

2018 දී වෙළඳ පොලේ ඇති පළතුරු හා එළවලු වල පලිබෝධනාශක ශේෂ හඳුනාගැනීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් විමර්ශනයක් ආරම්භ කරන ලදී.

පරිපාලන දිස්ත්‍රික්ක 25කින් ලබාගන්නා ලද සාම්පල, ආහාර පාලක මණ්ඩලය මගින් රස පරීක්ෂක දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබුණි. දෙපාර්තමේන්තුවේ ආහාර විශ්ලේෂණ විද්‍යාගාරය නවීන රසායනික විශ්ලේෂණ උපකරණ භාවිතා කර එම සාම්පල පලිබෝධනාශක වර්ග 16ක් සඳහා විශ්ලේෂණය කරන ලදී.

පළතුරු සාම්පල හාරසීය හතලිස් දෙකක් (442) හා එළවලු හා පලා වර්ග සාම්පල තුන්සිය පනස් එකක් (351) විශ්ලේෂණයට භාජනය කරන ලදී. එම විශ්ලේෂණ ප්‍රතිඵල පහත වගුවේ දක්වා ඇත.

පළතුරු

පළතුරු වර්ගය	විශ්ලේෂිත සාම්පල් සංඛ්‍යාව	Profeno-fos අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Diazenone අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Bifenthrin අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Difeno-conazole අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Oxydixyl අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Chlorpyrifos අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)
මිදි	09	05 (0.04-0.08)	01 (0.16)	-	-	-	-
අඹ	67	-	-	03 (0.01-0.13)	02 (0.05-0.09)	-	-
පේර	81	41 (0.01-0.24)	-	-	-	-	-
කොමඩු	66	-	-	-	-	-	-
පැපොල්	75	01 (0.01)	-	-	-	01 (0.28)	-
කෙසෙල්	75	-	-	-	-		-
අන්නාසි	78	04 (0.02-0.11)	-	-	-		01 (0.02)
එකතුව	442						

එළවලු

එළවලු වර්ගය	විශ්ලේෂිත සාම්පල් සංඛ්‍යාව	Profeno-fos අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Diazenone අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Bifenthrin අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Difeno-conazole අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Oxydixyl අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)	Chlorpyrifos අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (mg/Kg)
වම්බටු	44	05 (0.01-0.07)	01 (0.17)	-	-	-	-
මෑ කරල්	27	04 (0.03-0.38)	-	-	01(0.78)	01(0.01)	-
පතෝල	30	05 (0.01-0.32)	-	-	-	-	01(0.01)
වැටකොලු	13	-	-	-	-	-	-
තක්කාලි	34	04 (0.02-0.12)	-	-	-	-	-
ලීක්ස්	31	-	-	-	-	-	-
බෝංචි	40	01 (0.02)	-	-	-	-	-
බණ්ඩක්කා	18	-	-	-	-	-	-
කැරට්	29	02 (0.23-1.0)	-	-	-	-	-
එකතුව	266						

පලා වර්ගය	විශ්ලේෂිත සාම්පල් සංඛ්‍යාව	Chloratha-lonil අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (පට/ණට)	Profenofos අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (පට/ණට)	Novaluron අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (පට/ණට)	ඵැල්ක්ංහක අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (පට/ණට)	Pyrados-trobin අඩංගු සාම්පල් සංඛ්‍යාව හා සාන්ද්‍රණය (පට/ණට)
මුකුණුවැන්න	44	09 (0.01-19.37)	10 (0.01-0.22)	03 (0.95-1.36)	04 (0.07-0.17)	02 (0.02-0.58)
ගොටුකොල	41	03 (0.02-0.8)	13 (0.01-21.98)	-	01 (0.02)	-
එකතුව	85					

මත්පැන් අංශය

ශ්‍රී ලංකාව තුල මත් පැන් විශ්ලේෂණ කටයුතු සිදු කරනු ලබන එකම විද්‍යාගාරය වන රස පරීක්ෂක දෙපාර්තමේන්තුවේ මත් පැන් විද්‍යාගාරය 2018 වර්ෂයෙදි නීති විරෝධී මත් පැන් සම්බන්ධ නඩු 4545 ක් සඳහා වාර්ථා නිකුත් කර ඇත. මෙම සංඛ්‍යාවෙන් ශ්‍රී ලංකාව තුල බල පත්‍ර රහිත නීති විරෝධී මත්පැන් නිෂ්පාදනයේ ප්‍රවනතාවය පැහැදිලි වේ.

2.4 රසායනාගාර ප්‍රතීතකරණ ක්‍රියාවලිය සම්බන්ධ තොරතුරු

විශ්ලේෂණ වල තත්වය උසස් කිරීම හා ප්‍රතීතකරණය

ශ්‍රී ලංකාවේ තිබෙන ප්‍රධානතම රජයේ විද්‍යාගාරය වන රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව මගින් සපයන සේවාවන් වල අධිකරණ විද්‍යාත්මක හා ආහාර විද්‍යාත්මක තත්වය ඉහළ තත්වයක පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුව බැඳී සිටී.

ඒ අනුව වාර්තා වල තත්වය ඉහල දැමීම සඳහා සියලුම විද්‍යාගාර ISO/IEC 17025 : 2005 ප්‍රමිති නියෝග වල අවශ්‍යතාවයට අනුකූලව අධිකරණ හා ආහාර විශ්ලේෂණය සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතතය මණ්ඩලය තුලින් ප්‍රතීතකරණය ලබා ඇත.

පහත සඳහන් වගුවට අනුව විද්‍යාගාර 9ක සිදු කරන විශ්ලේෂණ සඳහා ප්‍රතීතත්‍ය ලබා ඇත.

විද්‍යාගාරය	පරීක්ෂණය	සාම්පල් වර්ගය
ආහාර	Loss in mass	Black tea
	Total ash	
	Water soluble ash as a percentage of total ash	
	Acid insoluble ash	
	Alkalinity of water soluble ash	
	Water extract	
	Crude fiber	
	Biological Oxygen Demand (BOD)	Waste water and effluents
	Chemical Oxygen Demand (COD)	
මධ්‍යසාර	Ethyl Alcohol content	Beer
	PH	
අධිකරණ ධූලක විද්‍යා	Blood Alcohol	Blood

අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්. ඒ	DNA matching	Blood
මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක අංශය	Quantitative analysis of Heroin	Seized material
ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා	Physical examination, classification and comparison of fired cartridge cases	Fired cartridge cases
	Physical examination, classification and comparison of fired bullets	Fired Bullets
පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය	Identification of TNT and RDX	Explosive materials
විවිධ විද්‍යා නඩු අංශය	Serial number restoration	Vehicles
සැක කටයුතු ලේඛණ අංශය	Examination of handwriting	Documents

ශ්‍රී ලංකාවේ ප්‍රතීතකරණ මණ්ඩලය මගින් ඉහත වගුවේ සඳහන් විශ්ලේෂණ සඳහා 2017, නොවැම්බර් මාසයේදී ආවේක්ෂණ විගණනයක් සිදුකර විද්‍යාගාර 8ට අයත් නව විෂය පථය සඳහා ISO/IEC 17025 ප්‍රමිති නියෝගවලට අනුකූලව 2018 මාර්තු 14 දින සිට ප්‍රතීතත්‍ය ලබා දෙන ලදී.

එම විෂය පථය පහත වගුවේ දක්වා ඇත.

විද්‍යාගාරය	පරීක්ෂණය	සාම්පල් වර්ගය
ආහාර අංශය	Arsenic (As)	Drinking water, bottled & potable
	Cadmium (Cd)	
	Chromium (Cr)	
	Copper (Cu)	
	Manganese (Mn)	
	Nickel (N)	
	Lead (Pb)	
	Selenium (Se)	
මධ්‍යසාර අංශය	Apparent alcoholic strength	Distilled Liquor
	Actual alcoholic strength	
අධිකරණ ධූලක විද්‍යා අංශය	Acid/Neutral/Base drugs screening & identification	Biological samples
අධිකරණ මස්තු විද්‍යා හා ඩී.එන්.ඒ අංශය	DNA analysis on Buccal swab samples	Buccal cells
මත්ද්‍රව්‍ය සහ මනෝවර්තක අංශය	Qualitative & Quantitative Analysis of Cocaine	Seized material
ගිනි අවි සහ ප්‍රක්ෂිප්ත විද්‍යා අංශය	Serial number restoration	Firearms
පුපුරණ ද්‍රව්‍ය හා ගිනි විමර්ශන අංශය	Analysis of ignitable liquid residues	Fire Debris
සැක කටයුතු ලේඛණ අංශය	Comparison of Rubber stamp impression	Documents

2019 වසරේදී ප්‍රතීතකරණය විෂය පථය දීර්ඝ කිරීම සඳහා 2018 නොවැම්බර් මාසයේදී දෙවන ආවේක්ෂණ විගණනය පවත්වන ලදී.

03
පරිච්ඡේදය

වත්කම් කළමනාකරණය

3.1 ස්ථාවර වත්කම් පිළිබඳ තොරතුරු

වත්කම් වර්ගය	මිනුම් ඒකකය	ප්‍රමාණය		වටිනාකම (පිරිවැය/ පොතේ අගය/නැවත ඇගයීම) රුපියල්
		භාවිතා කළ හැකි	භාවිතා කළ නොහැකි	
කාර්යාල ගොඩනැගිල්ල	වර්ග මීටර්	10200	-	1,100,000,000.00
වාහන	සංඛ්‍යාව	20	3	26,143,676.76
කාර්යාල උපකරණ	සංඛ්‍යාව	1428	49	5,167,930.34
පරිගණක උපකරණ	සංඛ්‍යාව	864	25	82,292,836.49
විදුලි උපකරණ	සංඛ්‍යාව	175	12	5,473,741.07
සන්නිවේදන උපකරණ	සංඛ්‍යාව	-	-	573,459.00
ගෘහ භාණ්ඩ	සංඛ්‍යාව	3040	6	178,802,831.04
පොත් පත් හා ලේඛන	සංඛ්‍යාව	13	-	1,198,725.49
විද්‍යාගාර උපකරණ	සංඛ්‍යාව	7168	278	773,580,448.07
ඉඩම	රූඩ්	3.75	-	83,000,000.00
එකතුව				2,256,233,648.26

3.2 නවීන විද්‍යාත්මක විශ්ලේෂණ උපකරණ මිලදීගැනීම

නඩු භාණ්ඩ විශ්ලේෂණ කටයුතු වඩා කාර්යක්ෂම කිරීම හා විශ්ලේෂණ පරාසයක් පුළුල් කිරීම සඳහා මෙන්ම වඩා විශ්වාසවන්ත භාවයකින් යුක්තව තම විශේෂඥ මතය ඉදිරිපත් කිරීම සඳහා අන්තර්ජාතික වශයෙන් පිළිග නු ලබන පහත සඳහන් නවීන විද්‍යාත්මක විශ්ලේෂණ උපකරණ වර්ෂය තුලදී මිලදී ගැනීමට කටයුතු කර ඇත.

උපකරණයේ නම	අපේක්ෂිත කාර්යන්
Alcolizer	■ පැසවීමෙන්ලත් මත්පැන් ස්වයංක්‍රීයව විශ්ලේෂණය කිරීම.
VSC (Video Spectral Comparator)	■ සැක කටයුතු ලේඛන පරීක්ෂා කිරීම.
GC/FID (Gas Chromatograph/ Flame-Ionization Detector)	■ ධූලක විද්‍යා අංශය මගින් පශ්චාත් මරණ ශරීර ආදර්ශ වල හා අනෙකුත් නඩු භාණ්ඩ වල විවිධ ඖෂධ හා සමහර පළිබෝධ නාශක අංශු මාත්‍ර හඳුනා ගැනීම.
Gas Generators • Hydregon • Nitrogen • Air	■ වායු වර්ණ ලේඛ ශිල්ප ක්‍රමය (Gas Chromatograph) මගින් සිදු කරන විශ්ලේෂණ සඳහා අවශ්‍ය වායු වර්ග නිපදවීම සඳහා මත්ද්‍රව්‍ය අංශය, ධූලක විද්‍යා අංශය හා ආහ-ාර අංශ වල මෙම උපකරණ භාවිතා කරති.

04
පරිච්ඡේදය

මානව සම්පත් කළමනාකරණය හා පරිපාලනය

4.1 2018.12.31 දිනට කාර්ය මණ්ඩල වාර්තාව

		තනතුර	සේවය	ශ්‍රේණිය	වැටුප් කේතය	අනුමත සේවක සංඛ්‍යාව			දැනට සිටින සේවක සංඛ්‍යාව				පුරප්පාඩු සංඛ්‍යාව
						ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	ස්ථිර	කොන්ත්‍රාත්	අනියම්	වෙනත් (වැ.බ)	
Senior Level	1	ආණ්ඩුවේ රස පරීක්ෂක	SLSS	Sp.	SL 3	1			1				0
	2	ආණ්ඩුවේ අතිරේක රස පරීක්ෂක (විශේෂ පන්තිය)*	SLSS	Sp.	SL3	2			0			2	2
	3	සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ පරීක්ෂක**	SLSS	Sp.	SL3	1			1				0
	4	ආණ්ඩුවේ නියෝජ්‍ය රස පරීක්ෂක ***	SLSS	I	SL 1	8			2			8	6
	5	සැක කටයුතු ලේඛණ පිළිබඳ ාණ්ඩුවේ නියෝජ්‍ය පරීක්ෂක****	SLSS	I	SL 1	2			0			2	2
	6	අධ්‍යක්ෂ පරිපාලන ශ්‍රී.ල.ප.සේ. 1 පන්තිය*****	SLAS	I	SL 1	1			0	1			1
	7	ප්‍රධාන ගණකාධිකාරී ශ්‍රී.ල.ග.සේ. 1 පන්තිය	SLAcS	I	SL 1	1			1				0
	8	අභ්‍යන්තර විගණක	SLAcS	II/III	SL 1	1			0				1
	9	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක /සහකාර රස පරීක්ෂක******	SLSS	II/III	SL 1	93			65				28
	10	සැක කටයුතු ලේඛණ පිළිබඳ ආණ්ඩුවේ ජ්‍යෙෂ්ඨ පරීක්ෂක/ සහකාර පරීක්ෂක	SLSS	II/III	SL 1	14			10				4
	11	ශ්‍රී.ලං.ග.සේ. මෙම පන්තිය	SLAcS	II /III	SL 1	1			1				0
Tertiary Level	12	රසායනාගාර සහකාර සේවය (අධි පන්තිය)	SLTS Supra	Sp.	MN 7	5			2				3
	13	පරිපාලන නිලධාරී*******	PMAS Supra	Sp.	MN 7	1			0	1			1
	14	භාෂා පරිවර්තක සේවය	TS	III	MN 6	2			0				2
	15	ශ්‍රී.ලං.තො.හා ස.තා.සේවය 2 පන්තියේ 11/1 ශ්‍රේණිය ********		II	MN 6	2			0			1	2
Secondary Level	16	පරීක්ෂණ නිලධාරී	Dept		MN 4	1			1				0
	17	සංවර්ධන නිලධාරී	POS		MN 4	6			1				5
	18	පුස්තකාලයාධිපති	SL-GLS		MN 3	1			0				1
	19	රසායනාගාර සහකාර සේවය	Dept	I/II/III	MN 3	50			40				10
	20	යතුරු ලේඛක	Dept	I/II/III	MN 2	10			0				10
	21	රාජ්‍ය කළමණාකරණ සහකාර සේවය	PMAS	I/II/III	MN 2	36			36				0

	22	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර	Dept	I/II/III	MT 1	10			1				9
	23	පරිගණක ක්‍රියාකරු	Dept	I/II/III	MN 1	1			1				0
Primary level	24	රියදුරු සේවය	DS	I/II/III	PL 3	21			17				4
	25	ගොඩනැගිලි නඩත්තු සහයක	Dept	I/II/III	PL 2	2			0				2
	26	රසායනාගාර සහායක	Dept	I/II/III	PL 2	12			5				7
	27	පුස්තකාල සහායක	Dept	I/II/III	PL 2	1			1				0
	28	කාර්යාල සේවක සේවය	OES	I/II/III	PL 1	38			28				10
	29	විද්‍යාගාර ඔර්ඩලි	Dept	III	PL 1	10			10				0
		එකතුව				334			224	2	0	13	110

සටහන්

* - වැඩ බැලීමේ පදනම මත.
** - විශේෂ පන්තියේ තනතුර අනුමත වුවත් පත් කර නොමැත.
*** - තනතුරු අටක් සඳහා වැඩ බැලීමේ පදනම මත
**** - තනතුරු දෙකක් සඳහා වැඩ බැලීමේ පදනම මත
***** - කොන්ත්‍රාත් පදනම මත
****** - තත්ත්ව ආරක්ෂණ විද්‍යඥ තනතුර යටපත් කර, තත්ත්ව ආරක්ෂණ සහකාර තනතුර ආණ්ඩුවේ සහකාර රස පරීක්ෂක තනතුරක් ලෙස 2018.09.17 දින සිට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කර ඇති අතර අදාල තනතුර පත්කිරීමට රා.සේ.කොා. වෙත යොමු කිරීමට කටයුතු සිදු කරමින් පවතී.
******* - කොන්ත්‍රාත් පදනම මත
******** - එක් තනතුරක් සඳහා රාජකාරි ඉටු කිරීමේ පදනම මත

සේවක කාණ්ඩ මට්ටම	අනුමත සංඛ්‍යාව	දැනට සිටින සංඛ්‍යාව
ජ්‍යෙෂ්ඨ මට්ටම	125	81
තෘතීය මට්ටම	10	2
ද්විතීය මට්ටම	115	80
ප්‍රාථමික මට්ටම	84	61
එකතුව	334	224

4.2 2018 වර්ෂයේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු

4.2.1 දේශීය

	නිලධාරියාගේ නම	තනතුර	පශ්චාත් උපාධිය	ආයතනය
1	යූ ජී එස් ටී ගමගේ මිය	සහකාර රස පරීක්ෂක	MSC in Analytical Chemistry	කොළඹ විශ්ව විද්‍යාලය
2	ජේ එම් පී අයි ජයතිලක මිය	සහකාර රස පරීක්ෂක		
3	එච් එන් ඒ පෙරේරා මිය	සහකාර රස පරීක්ෂක		
4	ආර් ඒ බී එස් රණසිංහ මිය	සහකාර රස පරීක්ෂක		
5	යූ ඩබ් එස් ප්‍රේමතිලක මිය	සහකාර රස පරීක්ෂක		

4.2.2 විදේශීය

	නිලධාරියාගේ නම	කාල සීමාව	පශ්චාත් උපාධිය	විශ්වවිද්‍යාලය
1	සී. පී කුමාරපේලි මිය	2018.09.10 - 2019.09.10	M.Sc in Pharmaceutical Analysis	Stratchclyde-Scotland එක්සත් රාජධානිය
2	ආර්. ඩබ්. ආර්. කේ රත්නායක මිය	2018.09.10 - 2019.09.10	M.Sc in Forensic Science	Stratchclyde-Scotland එක්සත් රාජධානිය
3	එම්. ඒ. ජේ ප්‍රනාන්දු මිය	2018.09.10 - 2019.09.10	M.Sc in Pharmaceutical Analysis	Stratchclyde-Scotland එක්සත් රාජධානිය
4	එන්. අයි. කේ ප්‍රනාන්දු මිය	2018.09.17 - 2019.09.30	M.Sc in Fire Investigation	Lankeshire එක්සත් රාජධානිය

4.3 2018 වර්ෂයේ පුහුණු හා හැකියා වර්ධන කටයුතු

	නිලධාරියාගේ නම	තනතුර	කාල සීමාව	පුහුණුව/ වැඩමුළුව	ආයතනය
1	කේ.වී.රත්නපාල මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.01.29 & 2018.01.30	Training on ISO/ IEC 17025:2005- Internal Auditing of Laboratory Management Systems	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය
2	ටී.ආර්.එම්.සී.දිල්හානි මිය	සහකාර රස පරීක්ෂක			
3	ඩබ්.ඩී.වී.කරුණාරත්න මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.02.07	Institute of Chemistry Ceylon	Institute of Chemistry Ceylon
4	කේ.ඒ.පී.බන්දුමාලා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
5	අයි.ජේ.අඹේපිටිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
6	පී.ඒ.ඩී.අමිල මයා	ගණකාධිකාරී		Diploma in Public Procurement	මිලෝදා පුහුණු ආයතනය
7	එස්.කේ.එන්.සඳගිරි මයා	සැකකටයුතු ලේඛන පිළිබඳ ආ.ස.ප.	2018.02.27 & 2018.02.28	Workshop on staff Disciplinary Procedure in Public Service	Distance Learning Centre Ltd
8	ජේ.එම්.ආර්.ජයසුන්දර මයා	සැකකටයුතු ලේඛන පිළිබඳ ආ.ජ්‍යෙ..ප.	2018.02.21& 2018.02.22	Disciplinary Procedure in Public Service	Distance Learning Centre Ltd
9	ජේ.එම්.ආර්.ජයසුන්දර මයා	සැකකටයුතු ලේඛන පිළිබඳ ආ.ජ්‍යෙ..ප.	2018.03.08 & 2018.03.09	General Training Transition of Laboratory Quality Management System to ISO/IEC 17025:2017	අනුකූලතා තක්සේරු පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රතිතන මණ්ඩලය
10	ඩබ්.ඩී.වී.කරුණාරත්න මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
11	වී.ජේ.බණ්ඩාරනායක මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
12	වී.ජී. ද සිල්වා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.03.29	Genaral Workshop on Waste Disposal in Testing and Medical Laboratories	Sri lanka Association of Testing Laboratories (SLATL)
13	එස්.එල්.ආර්. ගුණවර්ධන මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
14	එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.03.23	seminar on Industrial waste Management and Laboratory Safty	Institute of Chemistry Ceylon
15	එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.04.19& 2018.04.20	Genaral Training Transition of Laboratory Quality Management System to ISO/IEC 17025:2017	Sri lanka Accredition Board (SLAB)
16	ඩබ්.එම්.ඒ. කුමාර මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
17	එම්.ඊ.ජේ. සෙනෙවිරත්න මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			

18	එම්.එච්.එස්.පී.කේ ද සිල්වා මයා.	ප්‍රධාන ගණකාධිකාරී	2018.05.03	New Inland Revenue Act, Income Tex on Employment Income, withholding Taxes & Income Tax on (capital) Gains and Losses	D.P.R Consultants (Private) Limited
19	එම්.ඒ.කේ.කේ.පී. පෙරේරා මිය.	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.05.31	Training Programme on Uncertainty Estimation in Measurement Science	මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව
20	කේ.ඒ.ඩී.සී. කොඩිතුවක්කු මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
21	එස්.පී. හපුතන්ත්‍රි මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.05.21	Seminar on Quality and safty in Food industry	Institute of Chemistry Ceylon
22	එච්.ඩබ්.සී.සී. කරුණාරත්න මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
23	කේ.ඒ.එස්.අයි.කේ.කළුආරච්චි මයා	සැකකටයුතු ලේඛන පිළිබඳ ආ.ජ්‍ය..ප.	2018.06.18& 2017.06.19	Internal Auditing as ISO/IEC 17025:2017	Sri lanka Accreditation board(SLAB)
24	එම්.ඊ.ජේ. සෙනෙවිරත්න මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
25	පී.එස්.කේ. රාජපක්ෂ මිය	නියෝජ්‍ය රස පරීක්ෂක	2018.06.25& 2018.06.26	Genaral Training Transition of Laboratory Quality Management System to ISO/IEC 17025:2017	Sri lanka Accreditation board(SLAB)
26	එන්.අයි.කේ. ප්‍රනාන්දු මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
27	ඩබ්.ඒ.අයි.ඩී. ප්‍රේමචන්ද්‍ර මෙය	සැකකටයුතු ලේඛන පිළිබඳ ආ.ජ්‍ය..ප.			
28	එම්.ජී.එස්.ඒ. විමලසේන මිය	නියෝජ්‍ය රස පරීක්ෂක	2018.07.05& 2018.07.06	Documentation of Laboratory Quality Management System as per ISO/IEC 17025:2017	Sri lanka Accreditation board(SLAB)
29	ඩබ්.එස්.එච්.කේ. ජයවංශ මිය	ත.ආ.සහකාර			
30	එස්.පී. හපුතන්ත්‍රි මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.07.16& 2018.07.17	Genaral Training Transition of Laboratory Quality Management System to ISO/IEC 17025:2017	Sri lanka Accreditation board(SLAB)
31	කේ.ඒ.පී.බන්දුමාලා මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
32	ඩබ්.එම්.එස්.ආර්.රත්නායක මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
33	පී.සී.පී. ලලන්තිකා මිය	රා.ක.ස.ෂෂෂ	2018.07.03& 2018.07.04& 2018.07.05	Public Financial Regulations	Miloda Academy of Financial Regulations
34	ඩී.ඩී. රේණුකා දහනායක මෙය	රා.ක.ස.ෂෂෂ	2018.08.14& 2018.08.15& 2018.08.16	File Management & Genaral Office Administation E-Code	Miloda Academy of Financial Studies
35	කේ.සී.ඒ. සිල්වා මෙය	රා.ක.ස.ෂෂෂ			
36	ජේ.එම්.ආර්.ජයසුන්දර මයා	සැකකටයුතු ලේඛන පිළිබඳ ආ.ජ්‍ය..ප.	2018.10.04& 2018.10.05	Internal Auditing as ISO/IEC 17025:2017	Sri lanka Accreditation board(SLAB)
37	යූ.එල්.කත්‍රිආරච්චි මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
38	එච්.ඩබ්.සී.සී. කරුණාරත්න මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක	2018.09.07	Seminar on Practices of Modern Analyticle Methods For Industries Chromatographic Techniques and Spectroscopic Identification Techniuque.	Institute of Chemistry Ceylon
39	එස්. කුලලී මෙය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
40	පී.ජී.පී. චන්ද්‍රසිරි මයා	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
41	එස්. ඒ. සපුතන්ත්‍රි මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
42	ටී.එච්.කුරුකුලනාථ මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
43	ඩී.ආර්..අයි.උදේශිනී මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			
44	එම්.ජී.එස්.ඒ. විමලසේන මිය	නියෝජ්‍ය රස පරීක්ෂක	2018.09.27& 2018.09.28	Documentation of Laboratory Quality Management System as per ISO/IEC 17025:2017	Sri lanka Accreditation board(SLAB)
45	එන්.එස්.එච්.කේ. ජයවංශ මිය	ජ්‍යෙෂ්ඨ සහකාර රස පරීක්ෂක			

4.4 2018 විදේශීය පුහුණු හා සම්මන්ත්‍රණ

	නිලධාරියාගේ නම	කාල සීමාව	පුහුණුව/වැඩමුළුව	පැවැති රට
1	එස්. පී හපුතන්ත්‍රි මිය	2018.02.04-2018.03.02	Sida International Training Programme " Quality Infrastructure for food safety	ස්වීඩනය
2	එස්.කේ.එන්.සඳගිරි මයා	2018.03.22-2018.04.11	Capacity Development on Cyber - Policing	කොරියාව
3	එම්.ජී.එස්.ඒ. විමලසේන මිය	2018.04.30-2018.05.02	World Conference on Quality and Improvement	ඇමෙරිකා එක්සත් ජනපදය
4	ඩබ්.එම්.පී.බී.කේ වර්ණසූරිය මිය	2018.05.07-2018.05.24	The training programme on " Advanced Food Analyst "	තායිලන්තය
5	පී. එස්. කේ රාජපක්ෂ මිය	2018.05.14-2018.05.18	27th Session of the Commission on Crime Prevention And Criminal Justice (CCPCJ)	ඔස්ට්‍රියාව
6	එච්. ටී. ටී ප්‍රියදර්ශණී මිය	2018.05.15-2018.05.22	RE: LCMS Application Training	සිංගප්පූරුව
7	දීපිකා සෙනෙවිරත්න මිය	2018.05.21-2018.05.22	3rd Global Food Security and Sustainability Conference	ඇමෙරිකා එක්සත් ජනපදය
8	එස්. ඒ බටකන්දගේ මයා	2018.06.11-2018.06.12	2nd World Confernece and Exhibition on Forensic Sciecnce	ඉතාලිය
9	ඩී. එච්. එල්. ඩබ් ජයමාන්න මයා			
10	ඒ. සී. එස් ධර්මරත්න මිය	2018.06.06-2018.08.09	The 4th AFSN Trace Evidence Work Group Training and Meeting on ASEAN Explosive Data base	තායිලන්තය
11	ඒ වැලිඅංග මයා	2018.09.04-2018.09.08	AFSN 10th Annual Meeting and Symposium	චීනය
12	කේ. පී චන්ද්‍රානි මිය	2018.10.05-2018.10.08	The choose food symposium	ඇමෙරිකා එක්සත් ජනපදය
13	එස්. පී හපුතන්ත්‍රි මිය	2018.10.07-2018.10.12	Quality infrastructure for food safety	මලයාසියාව
14	ඒ. ඩී. එස් රත්නකුමාර මයා	2018.07.16-2018.07.27	Fingerprint Science & Queetioned Document Examination	ඉන්දියාව
15	කේ. ඒ. එස්. අයි. කේ කළුආරච්චි මයා	2018.07.30-2018.08.03	Course on Expert testimony in criminal trail	ඉන්දියාව
16	එස්.කේ.එන්.සඳගිරි මයා	2018.07.30-2018.08.10	Course on Crime Science Management including CCTV analysis	ඉන්දියාව
17	අයි. එච් කුලතුංග මිය	2018.08.06-2018.08.10	Course on forensic Science & Forensic Medicine	ඉන්දියාව
18	ඒ.එම්.එන්.ඩී චන්ද්‍රවංශ මෙය	2018.08.27-2018.09.01	Course on Cyber Forensics	ඉන්දියාව
19	ඩබ්.එම්.පී.බී.කේ වර්ණසූරිය මිය	2018.09.10-2019.09.15	Training Programme for exposure for food laboratory	තායිලන්තය
20	කේ.පී.ජී.කේ.ටී ගුරුගේ මෙය			
21	අයි ජේ අඹේපිටිය මිය			
22	එස්.එල්.ආර් ගුණවර්ධන මිය	2018.09.10-2018.09.21	Course on the Enhancement Laboratory skill in quantitative Mass Spectrometry	පින්ලන්තය
23	වයි.එම්.ඩබ්.එස් බණ්ඩාර මයා	2018.09.10-2018.09.18	Training Programme for on public Administrative & Development	ඉන්දියාව
24	පී ජී ද සිල්වා මිය	2018.10.25-2018.10.26	HID User Meeting - Thermo Fisher Scientific	ඉන්දියාව
25	ආර්. එම්. බී. එස් රණසිංහ මිය			
26	එම්. වී. ඩී මාලා මිය	2018.11.06-2018.1126	Seminar on Certification and Accreditation	චීනය
27	අයි ජේ අඹේපිටිය මිය	2018.11.20-2018.11.23	Agilent 7900 ICP-MS Techniques & Operation	සිංගප්පූරුව
28	ඊ එම් ඩී ටී ඊ උඩංගමුව මයා	2018.12.09-2018.12.15	Investigation into Public Revelations made by Mr. Namal Kumara against DIG Mr. Nalaka de Silva	හොංකොං
29	එච්. ටී. ටී ප්‍රියදර්ශණී මිය	2018.11.26-2018.12.08	Bio Medical Waste Management	ඉන්දියාව

Government Analyst's Department

No. 31, Isuru Mawatha, Pelawatta,Battaramulla, Sri Lanka.
E-mail: govanalyst@sltnet.lk
Telephone: 94 112176800 / 94 112786395
Fax: 94 112786394

PRINTEC | 0112 815 816